ඇඹිලිපිටිය කලාප අධ්‍යාපන කාර්යාලය
வலயக் கல்விக் காரியாலயம் எம்பிலிப்பிட்டிய
Embilipitiya Zonal Education Office

**80 | S | I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - ආදර්ශ ප්‍රශ්ණ පත්‍රය - I
பொதுக் கல்விச் சான்றிதழ் (சாதாரண தரப்) பரீட்சை - மாதிரி வினாத்தாள் - I
Genaral Certificate of Education (Ord. Level) Examination - Model Paper - I

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - I , II
தகவல் மற்றும் தொடர்பாடல் தொழினுட்பம் - I , II
Information & Commiunication Technology - I , II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - I

සැලකිය යුතුයි
- ★ සියළු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න
- ★ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1),(2),(3),(4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් සුදුසු පිළිතුර තෝරා ගන්න.

1. පහත සඳහන් කුමක් භාවිතකරුවකුගේ දත්ත සැකසුම් කාර්යයට උදාහරණයක් නොවේද?
   (1) ශිෂ්‍යයකු ලබාගත් සාමාන්‍ය ලකුණු පැතුරුම්පත් මෘදුකාංගයක් භාවිතයෙන් ගණනය කිරීම
   (2) කාර්යාලයක චික් චික් සේවකයින්ගේ මාසික පැමිණීමේ වාර්තාවක් සැකසීම
   (3) වෙබ් අතරික්සුවක් භාවිතයෙන් නවකතා පොතක් කියවීම
   (4) දරුවන්ට දිවා ආහාරය ලබා දීමට අවශ්‍ය වියදම් ඇස්තමේන්තුවක් සැකසීම

2. පහත ආදාන උපක්‍රම වලින් දැක්වුම් උපාංගයක් (pointing device) අඩංගු නොවන පිළිතුර වන්නේ?
   (1) මූසිකය - යතුරු පුවරුව - චුම්බක තීන්ත අනුලක්ෂණ කියවනය - තීරු කේත කියවනය
   (2) මෙහෙයුම් යටිය - ආලෝක පෑන - ඩිජිටල් කැමරාව - වෙබ් කැමරාව
   (3) මයික්‍රෆෝනය - ණයපත් හා හරපත් කියවනය - චුම්බක තීන්ත අනුලක්ෂණ කියවනය - ප්‍රකාශ සලකුණු සංජානන උපක්‍රමය
   (4)ආලෝක පෑන - යතුරු පුවරුව - තීරු කේත කියවනය - වෙබ් කැමරාව

3. පරිගණක ආචයන උපාංග ධාරිතාවය අනුව ආරෝහණ අනුපිළිවෙලින් දක්වා ඇත්තේ?
   (1) සසම්භාවී ප්‍රවේශ මතකය - සංඛ්‍යාංක බහුවිධ තැටිය - සංයුක්ත තැටිය - රෙජිස්තර මතකය
   (2) දෘඪ තැටිය - සැනෙලි මතකය - සංඛ්‍යාංක බහුවිධ තැටිය - පඨන මාත්‍ර මතකය
   (3) සංඛ්‍යාංක බහුවිධ තැටිය - සසම්භාවී ප්‍රවේශ මතකය - පඨන මාත්‍ර මතකය - සැනෙලි මතකය
   (4) සංඛ්‍යාංක බහුවිධ තැටිය - පඨන මාත්‍ර මතකය - සංයුක්ත තැටිය - චුම්බක පටිය

4. පහත දක්වා ඇති පිළිතුරු අතරින් කුමක් මෙගාබයිට් එකකට තුල්‍ය වේද?
   (1) 1024 KB (2) $1 \times 2^{10}$ BYTES
   (3) $1 \times 2^{10}$ KB (4) ඉහත (1) හා (3) පිළිතුරු දෙකම

5. කොඳු නාරටිය (Backbone) ලෙස හඳුන්වන ප්‍රධාන කේබලයක් හරහා සියලු සම්බන්ධතා ඇති කරමින් ජාලගත කිරීම දැකිය හැකි ජාල ස්ථල ආකාරය වන්නේ?
   (1) තරු ආකාරය (2) මුදු ආකාරය (3) බස් ආකාරය (4) දැල් ආකාරය

6. ලංකා රජය හා සම්බන්ධ කටයුතු කර ගැනීමේදී සහ රාජ්‍ය තොරතුරු ලබා ගැනීමේදී යොදා ගත හැකි රජය හා එක්ව ක්‍රියා නොකරන්නේ පහත කවරක්ද?
   (1) ශ්‍රී ලංකා රජයේ වෙබ් පිටුව (2) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය
   (3) Google සමාගම (4) රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය

Visit- www.enenapiyasa.lk

7. ASCII කේත ක්‍රමයේ B අනුලක්ෂණය $1000010_2$ ලෙස නිරූපණය වේ නම් E අනුලක්ෂණයට අදාල නිවරදි කේතය වන්නේ
   (1) $1000001_2$ (2) $1000100_2$ (3) $1000101_2$ (4) $1000110_2$

8. පහත දී ඇති සංඛ්‍යා හතර අතුරින් අවරෝහණ අනුපිළිවෙලට නිවරදිව සකස් කර ඇත්තේ
   (1) $1000110_2$ , $3F_{16}$ , $24_8$ , 60 (2) $11110_2$ , $24_8$ , $12_{16}$ , 35
   (3) $10000110_2$ , $102_8$ , $3F_{16}$ , 60 (4) $24_8$ , $1000110_2$ , $3F_{16}$ , 35

9. මේවා අතුරින් විවෘත,නිදහස් මෙහෙයුම් පද්ධති මෘදුකාංග පමණක් ඇතුලත්වන පිළිතුර වනුයේ,
   (1) Windows 7, Ubuntu, Android, Apple Mackintosh
   (2) Linux, Ubuntu, Android, Open BSD
   (3) Linux, Open BSD, Windows vista, Android
   (4) Apple Mackintosh, Windows 8, Open BSD, Android

10. මෙහෙයුම් පද්ධතිවල ක්‍රියාකාරිත්වය අනුව ඒවා වර්ග කෙරේ. ඒ අනුව නිවැරදි වර්ගීකරණයක් ඇතුලත්ව නොමැති පිළිතුර වනුයේ.
   (1) ඒක කාර්ය - Ms Dos (2) බහු කාර්ය - Mac Os
   (3) බහු පරිශීලක - Windows 8 (4) තත්‍ය කාල - ATM

11. වදන් සැකසුම් මෘදුකාංගයක භාවිත කරන කර්සරය ලේඛනයේ ආරම්භක ස්ථානයට(මුල්ම පිටුවේ) ගෙන්වා ගැනීමට භාවිත කළ යුතු යතුර හෝ යතුරු සංයෝගය කුමක්ද?
   (1) CTRL + A (2) CTRL + HOME (3) SHIFT + HOME (4) HOME

● පහත දැක්වෙන්නේ සමරවික්‍රම සමුහ ව්‍යාපාර ආයතනය විසින් 2022 ජනවාරි මාසයට අදාලව සැපයුම්කරුවකු ගෙන් ලබා ගන්නා ලද භාණ්ඩ කිහිපයක් පිළිබඳ විස්තර ඇතුලත් පැතුරුම්පතකින් උපුටා ගන්නා ලද කොටසකි. මෙය හොඳින් අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්න වලට නිවරදි පිළිතුරු සපයන්න.

| | A | B | C | D | E | F |
|---|---|---|---|---|---|---|
| 1 | january 2022 - Samarawickrama pvt LTD | | | | | |
| 2 | Item | Quantity | Unit Price | Total | Discount | Net Amount |
| 3 | Pen | 20 | 35 | | | |
| 4 | Book | 50 | 120 | | | |
| 5 | Eraser | 60 | 25 | | | |
| 6 | Lunch box | 35 | 300 | | | |
| 7 | Pencil | 22 | 30 | | | |
| 8 | | | | | | |
| 9 | Discount rate | | 5% | | | |

12. D3 කෝෂයට පෑන් සඳහා මුලු පිරිවැය ලබා ගැනීමට ඇතුළත් කළ යුතු නිවරදි සමීකරණය වන්නේ?
   (1) B3*C3 (2) = B3,C3 (3) = B3:C3 (4) = B3*C3


13. වට්ටම ගණනය කිරීමට E4 කෝෂයේ ඇතුලත් කළ යුතු නිවැරදි සමීකරණය වන්නේ?
   (1) = B3 * C$9 (2) = D3 * C9 $100 * 5 (3) D3 * C$9 (4) = D3 - C9

14. මුලු වටිනාකම ගණනය කිරීම සඳහා D8 කෝෂයට ඇතුලත් කළ යුතු නිවරදි සමීකරණය කුමක්ද??
   (1) SUM (D3:D7) (2) =D3 , D7 (3) = SUM (D3 : D7) (4) = SUM (D3 , D7)

15. පෑන් වල ශුද්ධ වටිනාකම ලබා ගැනීමට F3 කෝෂයට ඇතුලත් කළ යුතු සමීකරණය වන්නේ
   (1) = D3 – E3 (2) =D4 - E4 (3) =B3- E3 (4) =C3 - E3

16. ගුණාත්මක ඉ-සමර්පණයක ලක්ෂණයක් නොවන්නේ කවරක්ද?
   (1) කඳාවකට උචිත වන්නේ වාක්‍ය පේළි 6-9 අතර ප්‍රමාණයකි.
   (2) කඳාවකට යොදන අකුරුවල ප්‍රමාණය පොයින්ට් 20 හෝ ඊට වැඩි විය යුතුය.
   (3) පින්තූර, චිත්‍රක, වගු සහ ප්‍රස්තාර ආදිය අන්තර් ගත කරන්නේ නම් එක් කඳාවකට ඇතුළත් කිරීමට යෝග්‍ය වන්නේ උපරිම 2 ක් පමණි.
   (4) චලන චිත්‍ර හා වීඩියෝ ඇතුළත් කරන්නේ නම් එක් කඳාවකට එකක් පමණක් ඇතුළත් කිරීම වඩාත් සුදුසුය.

● පහත 17,18 හා 19 ප්‍රශ්න සඳහා දී ඇති සම්බන්ධිත වගුව භාවිතා කර පිලිතුරු සපයන්න.




තුන්වන පිටුව බලන්න

Visit- www.enenapiyasa.lk

17. COURSE : STUDENT යන වගු අතර ඇති සම්බන්ධතාවය වනුයේ?
(1) ඒක-ඒක (2) ඒක - බහු (3) බහු - බහු (4) කිව නොහැකිය

18. STUDENT වගුවේ ඇතුළත් ක්ෂේත්‍ර ගණන වනුයේ?
(1) 3 (2) 6 (3) 5 (4) 8

19. COURSEID යන පොදු ක්ෂේත්‍රය STUDENT වගුවේ **"A"** ලෙසද, COURSE වගුවේ **"B"** ලෙසද හඳුනාගත හැකිය. **"A"** හා **"B"** පිළිවෙලින්
(1) A- ප්‍රාථමික යතුර B- ආගන්තුක යතුර
(2) A- ආගන්තුක යතුර B- ආගන්තුක යතුර
(3) A- ප්‍රාථමික යතුර B- ප්‍රාථමික යතුර
(4) A- ආගන්තුක යතුර B- ප්‍රාථමික යතුර

20.
```
<html>
        <head>
                <A> Sri Lanka </title>
        <B>
</html>
```
ඉහත **A** හා **B** හිස්තැන් සඳහා සුදුසු උසුලන පිළිවෙලින්?
(1) A- <title> B- <body>
(2) A- <body> B- <head>
(3) A- <body> B- </title>
(4) A- <title> B- </head>

21. දෝෂ ඇති අවස්ථා වල පණිවිඩ දැන්වීම හා පණිවිඩ පාලනය සඳහා භාවිතා කරන අන්තර්ජාලයේ ක්‍රියාත්මක වන නියමාවලිය කුමක්ද?
(1) HTTP – Hypertext Transfer Protocol
(2) SMTP – Simple Mail Transfer Protocol
(3) ICMP – Internet Control Message Protocol
(4) FTP – File Transfer Protocol

22.
```
< ol type = "I">
        <li> සිංහල</li>
        <li> දෙමළ < </li>
        <li> ගණිතය</li>
< /ol>
```
ඉහත HTML උසුලන වලට අදාළව ලැබෙන ප්‍රතිදානය වන්නෙ?

(1) I සිංහල
II දෙමළ
III ඉංග්‍රීසි

(2)
- සිංහල
- දෙමළ
- ඉංග්‍රීසි

(3) i සිංහල
ii දෙමළ
iii ඉංග්‍රීසි

(4)
✓ සිංහල
✓ දෙමළ
✓ ඉංග්‍රීසි

23. අංකිත ග්‍රාෆික සම්බන්ධයෙන් පහත ප්‍රකාශ සළකන්න,
A ) අංකිත ග්‍රාෆිකයක මූලිකාංග ලෙස පික්සල්, විභේදනය, ප්‍රමාණය, වර්ණය දැක්විය හැකිය.
B ) ග්‍රාෆිකයකට යොදා ඇති වර්ණ තීරණය වන්නේ පික්සලයක බිටු ප්‍රමාණය මගිනි.
C ) පික්සළ ප්‍රමාණය අඩු වන විට ග්‍රාෆිකයක ගුණාත්මක බව වැඩි වේ.
මින් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ
(1) A පමණි (2) C පමණි (3) A සහ B පමණි (4) ABC සියල්ල

24. ඒකාකාර සම්පත් නිශ්චායකයක කොටස් අනුපිළිවෙලින් දක්වා ඇති පිළිතුර වන්නේ?
(1) නියමාවලිය - වසම් නාමය - සේවාව - සම්පත් පවතින ස්ථානය
(2) වසම් නාමය - සේවාව - නියමාවලිය - සම්පත් පවතින ස්ථානය
(3) සම්පත් පවතින ස්ථානය - නියමාවලිය - සේවාව - වසම් නාමය
(4) නියමාවලිය - සේවාව - වසම්නාමය - සම්පත් පවතින ස්ථානය

Visit- www.enenapiyasa.lk

25. වෙබ් අඩවි සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශයක් ඇතුළත් වන වරණය කුමක්ද?
(1) ස්ථිතික වෙබ් අඩවි යනු වෙබ් අඩවියේ සන්ධාරය නොවෙනස්ව පවතින ඒවා වේ.
(2) ගතික වෙබ් අඩවි වල සන්ධාරය නිරතුරුවම වෙනස් වේ.
(3) ගතික වෙබ් අඩවියක සන්ධාරය තුළ සේවාදායකය මගින් ජනනය වන තොරතුරු අන්තර්ගත වේ.
(4) ස්ථිතික වෙබ් අඩවි නිර්මාණය සඳහා PHP, JSP වැනි පරිගණක භාෂා යොදා ගනී.

26. http://donets.lk/exam/docs/examcal/dec.pdf යන URL එකෙහි වසම් නාමය වන්නේ?
(1) http (2) donets.lk (3) dec.pdf (4) www

27. පහත වසම් නාම වල අර්ථයන් පිළිවෙලින් ඇති පිළිතුර කුමක්ද?
**(A) .com (B) .gov (C) .net**
(1) වාණිජමය, ජාලගත, අධ්‍යාපන (2) අධ්‍යාපන, වාණිජමය, ජාලගත
(3) වාණිජමය, රාජ්‍ය, ජාලගත (4) ජාලගත, රාජ්‍ය, වාණිජමය

28. පහත මෘදුකාංග අතුරින් දෘශ්‍ය සන්ධාර නිර්මාණයට යොදා ගන්නා දෘශ්‍ය සංස්කාරක මෘදුකාංගයක් වන්නේ?
(1) Audacity (2) Giotto (3) Windows Movie Maker (4) GIMP

29. යම් හානිකර මෘදුකාංග වර්ගයක් පරිගණක වයිරස හා සමාන ලෙසින් ක්‍රියා කරයි. නමුත් එයට තනිව ක්‍රියාත්මක වීමේ හා පැතිර යාමේ හැකියාව ඇත. ඒ සඳහා විද්‍යුත් තැපැල් ඇමුණුම්, ව්‍යාජ වෙබ් අඩවි, ක්ෂණිකව මතුවන පණිවිඩ රාමු වැනි පරිගණක මූලික සමාජ ඉංජිනේරු උපක්‍රම යොදා ගනී. එම හානිකර මෘදුකාංග වර්ගය විය හැක්කේ?
(1) ඔත්තුකරුවන් (2) පරිගණක වර්ම්ස් (3) බොට්ස් (4) ෆිෂින්

30. ශ්‍රී ලංකාවේ 2022 වර්ෂයේ QR ක්‍රමයට ඉන්ධන නිකුත් කිරීමේ ක්‍රමය රට තුළ ආරම්භ වූ අතර එම ක්‍රමය රට පුරා එකවර ආරම්භ කිරීමට පෙර බස්නාහිර පළාතේ ප්‍රදේශ කිහිපයක පමණක් පළමුව ආරම්භ කරන ලදී. මෙම ක්‍රියාවලිය පද්ධති පිහිටුවීමේ කවර පියවරකට අයත් වේද?

(1) සමාන්තර පිහිටුවීම (2) නියමුමය පිහිටුවීම (3) අදියරමය පිහිටුවීම (4)සෘජු පිහිටුවීම

31. මෙහෙයුම් පද්ධති තුල ඇති උපයෝගිතා වැඩසටහන් සඳහා උදාහරණයක් වන්නේ?
A) උපස්ථ මෘදුකාංග (Backup software)
B) කාර්ය කළමනාකරු (Task Manager)
C) ගොනු / දත්ත සංකෝචක (File / Data Compression)
(1) A හා B පමණි (2) B පමණි (3) A හා C පමණි (4) A, B හා C සියල්ල

32. පරිගණක වෛරස විවිධාකාරයෙන් වර්ගීකරණය කළ හැකිය.

| | | | |
|---|---|---|---|
| 1 | ෆිෂින් (phshing) | A | අනවසරයෙන් වෙළඳ දැන්වීම් ප්‍රචාරණ කටයුතු සහිත විද්‍යුත් ලිපි යවමින් පරිශීලකයා පීඩාවට පත් කරයි. |
| 2 | ආයාචිත තැපෑල (spam) | B | අනවශ්‍ය වෙළඳ දැන්වීම් තීරය මත දර්ශනය කරමින් පරිශීලකයා පීඩාවට පත් කරයි. |
| 3 | කොල්ලකරුවා (hijacker) | C | ස්වයංක්‍රියව ක්‍රියාත්මක වෙමින් අනෙකුත් ජාල සමග සම්බන්ධ වෙමින් පරිශීලකයින්ගේ පෞද්ගලික තොරතුරු රැස් කර ගනී. |
| 4 | අනවශ්‍ය දැන්වීම් (adware) | D | පරිශීලකයින් අන්තර්ජාලය හා සම්බන්ධ වන විට වෙළඳ ප්‍රචාරණ කටයුතු මගින් නොමග යැවීම සිදු කරයි. |
| 5 | බොට්ස් (bots) | E | පරිශීලකයින් රවටා විද්‍යුත් තැපෑල හරහා ගිණුම් තොරතුරු ලබා ගනී. |

ඉහත එක් එක් වෛරස වර්ගය හා එහි ස්වභාවය නිවැරදිව දැක්වෙන්නේ?
(1) 1-B , 2- E, 3- A,4 – C, 5 – D (2) 1-A , 2- B, 3- D,4 – C, 5 – E
(3) 1-E , 2- A, 3- D,4 –B, 5 – C (4) 1-C , 2- B, 3- D,4 – E, 5 – A


33. පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශ පමණක් ඇතුළත් පිළිතුර අඩංගු වරණය තෝරන්න.
A) ඉහළ තලයේ පරිගණක භාෂා සඳහා **Cobol, Pascal** උදාහරණ වේ.
B) ඉහළ තලයේ පරිගණක භාෂා යන්ත්‍රය මත යැපෙන භාෂා වේ.
C) 0 හා 1 මත පදනම්ව එසෙම්බ්ලි භාෂාව ගොඩ නැගී ඇත.
D) එසෙම්බ්ලි භාෂාව යන්ත්‍රය මත යැපෙන භාෂාවකි.



Visit- www.enenapiyasa.lk

(1) A, B හා C පමණි (2) B,C හා D පමණි (3) A හා D පමණි (4) B හා C පමණි

● 34 හා 35 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා දී ඇති ගැලීම් සටහන උපයෝගී කර ගන්න.




34. දී ඇති ගැලීම් සටහනෙහි ප්‍රතිදානය ලෙස කුමක් දිස් වේද?

(1) 1 දිස් වේ. (2) 15 දිස් වේ.
(3) 3 දිස් වේ. (4) කිසිවක් දිස් නොවේ.

35. ගැලීම් සටහනෙහි පෙන්වා ඇති "ඔව්" සහ "නැත" යන ලේබල මාරු කළේ නම් එහි ප්‍රතිදානය වන්නේ කුමක්ද?

(1) 3 දිස් වේ. (2) 15 දිස් වේ.
(3) 1 දිස් වේ. (4) කිසිවක් දිස් නොවේ.

36. 1 සිට 100 දක්වා ඉරට්ටේ සංඛ්‍යාවල එකතුව ගණනය කිරීම සඳහා පහත ව්‍යාජ කේතය යොදා ගත හැකිය.

```
sum = 0
Num = 0
repeat
        num = num + 2
        sum = sum + num
until x
```

මෙහි x ට අදාළ අගය වනුයේ

(1) sum >100 (2) sum =100 (3) num >100 (4) num = 99

37. පහත ප්‍රතිදානයට අදාළ පැස්කල් කේතයේ හිස්තැන් සඳහා නිවැරදි පිළිතුර වන්නෙ

| | | | | |
|---|---|---|---|---|
| 15 | 60 | 18 | 33 | 50 |

```
var num: array [0...4] of integer
begin
        num [0]:=15;
        num [2]:=18;
        num [4]:=50;
        num [1]:= A  + 10;
        num [3] := num[0] + B
        for I : = 1 to 4 do
                writeln(num[i]);
end
```

(1) num[1], num[3] (2) num[4], num[1] (3) num[4], num[2] (4) num[0], 0

38. පහත Pascal කේතය සලකා ඊට අදාල ප්‍රතිදානය වනුයේ,

```
program question38;
var y: integer;
Begin
        y:=8;
        repeat
                write (y);
                y:=y+5;
        until y >30;
end.
```

((1) 13,18,23,28,33 (2) 8,13,18,25,30 (3) 8,13,18,23,28 (4) 8,15,17,23,30

● ප්‍රශ්ණ අංක 39 සහ 40 පහත තාර්කික පරිපථ ද්වාර පරිපථය මත පදනම් වේ.




39. ඉහත පරිපථයට අදාළ නිවැරදි සත්‍යතා වගුව වනුයේ,



Visit- www.enenapiyasa.lk

(1)

| A | B | F |
|---|---|---|
| 0 | 0 | 0 |
| 0 | 1 | 1 |
| 1 | 0 | 1 |
| 1 | 1 | 1 |

(2)

| A | B | F |
|---|---|---|
| 0 | 0 | 0 |
| 0 | 1 | 1 |
| 1 | 0 | 1 |
| 1 | 1 | 1 |

(3)


| A | B | F |
|---|---|---|
| 0 | 0 | 1 |
| 0 | 1 | 1 |
| 1 | 0 | 0 |
| 1 | 1 | 0 |

(4)


| A | B | F |
|---|---|---|
| 0 | 0 | 1 |
| 0 | 1 | 1 |
| 1 | 0 | 1 |
| 1 | 1 | 0 |

40. 39 ප්‍රශ්ණයට අදාල සත්‍යතා වගුවට අනුව එම පරිපථය මගින් නිරූපනය වන මූලික ද්වාරය කුමක්ද?


(1)




(2)



(3)



(4)



* * * *

Visit- www.enenapiyasa.lk

ඇඹිලිපිටිය කලාප අධ්‍යාපන කාර්යාලය
வலயக் கல்விக் காரியாலயம் எம்பிலிப்பிட்டிய
Embilipitiya Zonal Education Office

**80 | S | I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - ආදර්ශ ප්‍රශ්න පත්‍රය - I
பொதுக் கல்விச் சான்றிதழ் (சாதாரண தரப்) பரீட்சை - மாதிரி வினாத்தாள் - I
Genaral Certificate of Education (Ord. Level) Examination - Model Paper - I

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - I , II
தகவல் மற்றும் தொடர்பாடல் தொழினுட்பம் - I , II
Information & Commiunication Technology - I , II





## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - II

★ පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
★ පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමි වේ.

**1.** (i) සිසුවකු වෙළඳ සැලකට ගොස් කෑම පෙට්ටියක් හා වතුර බෝතලයක් මිලදී ගනී. අයකැමි වෙත ඉදිරිපත් කරන භාණ්ඩ ඔහු විසින් QR කේත කියවනය මගින් පරීක්ෂාකර බිල් පත නිකුත් කරයි. සිසුවා මුදල් ලබා දීමෙන් පසුව අයකැමි වෙතින් ඉතිරි මුදල ලබා ගනී. ඉහත සංසිද්ධියට අදාල ආදාන,ප්‍රතිදාන,ක්‍රියාවලිය සඳහා උදාහරණ 1 බැගින් ලියන්න.

(ii) (a) පාසලක පරිගණක විද්‍යාගාරයේ ඇති පරිගණක 20ක් ජාලගත කිරීමට භාවිත කල හැකි ජාල ස්තල විද්‍යා 2ක් ලියන්න.

(b) A-D තෙක් දක්වා ඇති ලේබල වලින් දැක්වෙන පරිගණක කෙවෙනි සලකා බලන්න.

|  |  |  |  |
|---|---|---|---|
| A | B | C | D |

පහත ලයිස්තුවේ දක්වා ඇති එක් එක් කෙවෙනියට සම්බන්ධ වන උපක්‍රමය සමග නිවැරදිව ගලපා **ලේබලය → උපක්‍රමය** ආකාරයෙන් ලියා දක්වන්න.
උපක්‍රම {මුද්‍රණ යන්ත්‍රය,ඩිජිටල් රූපවාහිනිය,මාර්ගකය,යතුරු පුවරුව,සුපරීක්ෂකය,මයික්‍රොෆෝනය}

(iii) (a) $AB2_{16}$ සංඛ්‍යාවට තුල්‍ය අෂ්ටමය සංඛ්‍යාවට පරිවර්තනය කරන්න.

(b) පහත දක්වා ඇත්තේ ASCII වගුවේ උපුටනයකි. "?" ලකුණට අදාල ද්විමය අගය ලියා දක්වන්න.

| Character | Decimal | Hexadecimal | Binary | Total |
|---|---|---|---|---|
| D | 68 | 44 | ? | 104 |

(iv) (a) පහත දක්වා ඇති බූලියානු ප්‍රකාශයට අදාල තර්කන ද්වාර පරිපථය අඳින්න.

$$F = A + (\overline{B} . B)$$

(b) ඉහත පරිපථයේ A = 1 , B = 1 විට F හි අගය ලියන්න.

(v) පරිගණකයේ ස්ථාපිත අනෙකුත් මෘදුකාංග විශ්ලේෂණය කිරීම සහ පරිගණකය නඩත්තු කිරීම වැනි ක්‍රියාවන් සඳහා උදවු කිරීමට නිර්මාණ කර ඇති මෙම මෘදුකාංග යෙදුම් මෘදුකාංග වලින් වෙනස් වන්නේ, සංකීර්ණත්වයෙන් සහ ක්‍රියාකාරීත්වයෙන්ය.
(a) ඉහත ඡේදයේ සඳහන් වන විශේෂිත මෘදුකාංගය කුමක්ද?
(b) ඒ සඳහා එක් උදාහරණයක් ලියන්න.



Visit- www.enenapiyasa.lk

(vi) පහත වගුව මගින් පෙන්වා ඇත්තේ A-D තෙක් ලේබල කරන ලද Victorian Giotto මෘදුකාංගය නිරූපක කිහිපයකි.



(A) (B) (C) (D)

අංක 1-5 තෙක් වු විස්තර ලැයිස්තුවෙන් A-D තෙක් වු නිරුපන සඳහා යෝග්‍ය විස්තර හදුනාගන්න. නිරුපන ලේබලය හා එයට අදාල වු විස්තරයේ අංකය ලේබලය → අංකය යන ආකාරයට ලියා දක්වන්න.

| විස්තරය | ක්‍රියාකරවීම (Start) | අවසාන රාමුව (End Frame) | නැවැත්වීම (Stop) | ආරම්භක රාමුව (Rewind) | තෝරා ගැනීම (Select) |
|---|---|---|---|---|---|
| අංකය | 1 | 2 | 3 | 4 | 5 |

(vii) P-S තෙක් ලේබල කරන ලද විස්තර පහත දි ඇති පද ලැයිතුවේ ඇති නිවැරදි පදය හා ගලපන්න. එක් එක් ලේබලය ඉදිරියෙන් එයට ගැලපෙන **පදය ලේබලය → පදය** ආකාරයෙන් ලියා දක්වන්න.

පද ලැයිතුව {Spam, IP ලිපිනය, HTTP, FTP, URL, Trash, Dream viewer, Google Chrome, spam}

| **ලේබලය** | **විස්තරය** |
|---|---|
| P | විශාල ප්‍රමාණයේ ගොනු අන්තර් ජාලයේ පරිගනක අතර හුවමාරු කිරීම සඳහා භාවිත කෙරෙ. |
| Q | HTML ලේඛන කියවීම සඳහා භාවිතා කරන යෙදුම් මෘදුකාංගයකි. |
| R | අනවශ්‍ය විද්‍යුත් ලිපි ආවනය සඳහා වු ෆෝල්ඩරය. |
| S | වෙබ් අඩවි තුල පවතින සම්පත් අනන්‍යව හදුනා ගැනිමට යොදා ගන්නා ක්‍රම වේ. |

(viii) පහත ව්‍යාජ කේතය සලකා බලන්න.

```
IF ((ICT > = 75) AND (English> = 50 AND Maths> = 50))
        Output "Qualified For the competition"
Else
        Output "NOT Qualified for the competition"
```

අපේක්ෂකයින් තුන් දෙනෙක් විෂයන් 03ක් සදහා ලබා ගත් ලකුණු පහත දී ඇත.

| නම | ICT | ගණිතය | ඉංග්‍රිසි |
|---|---|---|---|
| දිනිති | 83 | 65 | 70 |
| නසීර් | 78 | 80 | 89 |
| පෙරේරා | 65 | 78 | 80 |

ඉහත ව්‍යාජ කේතයට අනුව මෙම තරගය සඳහා සුදුසුකම් ලබන සියලු තරගකරුවන්ගේ නම් ලියා දක්වන්න.

(ix) (a) නොනවත්වා පරිගණක භාවිතා කිරීම නිසා ඇතිවන සෞඛ්‍ය ගැටලු දෙකක් ලියන්න.

(b) ලිඛිත දෑ සොරකම් වලක්වාලීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ගයක් ලියන්න.

(x) සමර්පනයක් හෙවත් ඉදිරිපත් කිරිමක් යනු පුද්ගලයෙක් හෝ පුද්ගල කණ්ඩායමක් තම අදහස්,සිතුවිලි,දැක්ම හෝ මතවාද වෙනත් අයට දැක්වීම පිනිස කරනු ලබන ඕනෑම ප්‍රයත්නයකි.ඒ අනුව ගුණාත්මක ඉ-සමර්පනයක ලක්ෂණ 2 ක් ලියන්න.

Visit- www.enenapiyasa.lk

**2.** (i) A සිට D තෙක් වූ ලේබල මගින් පෙන්වා ඇති විස්තර පහත දී ඇති පද ලැයිස්තුවෙහි ඇති නිවැරදි විස්තරය සමග ගලපන්න.එක් එක් ලේබලය ඉදිරියෙන් නිවැරදිව ගලපා ගත් පදයේ අංකය **ලේබලය → පදයේ අංකය** යන ආකාරයෙන් ලියා දක්වන්න.

| **ලේබලය** | **විස්තරය** |
|---|---|
| ස්විචය /නාභිය | දත්ත සම්ප්‍රේෂණය සදහා ගුවන් විදුලි තරංග මාධ්‍ය යොදා ගනියි |
| Firewall | අලෝකය පරාවර්තනය වෙමින් දත්ත සම්ප්‍රේශනයේ යෙදෙන වේගවත්ම දත්ත සම්ප්‍රේෂණ නියමු මාධ්‍යයි |
| Bluetooth / WiFi | පරිගනක දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අතර සම්බන්ධතාවයක් ගොඩ නැගීමට යොදා ගන්නා මාධ්‍ය උපක්‍රමයකි |
| ප්‍රකාශ තන්තු/ Fiber Optic | මෘදුකාංග හා දෘඩාංග ආකාරයෙන් පවතින ජාල ආරක්ෂක පද්ධතියකි |

(ii) P - S සිට තෙක් ලේබල් කර ඇති වගන්ති සහ එක් එක් වගන්තියේ හිස් තැනට පසුව ඇති කොටු වරහන් තුල ඇති පද දෙක සලකා බලන්න. එක් එක් වගන්තිය සදහා වගන්තියේ ලේබලය සහ හිස්තැනට අදාල වූ පදය, **ලේබලය → පදය** යන ආකාරයට ලියා දක්වන්න.

P). පික්සලයක බිටු ප්‍රමාණය තීරණය වන්නේ ..................... **{වර්ණ ගණන අනුවය/වර්ග අගලකට ඇති තිත් ප්‍රමාණය අනුවය}**

Q). තෘතීයික වර්ණයක් සෑදීමේදී RGB (245,102,36) ආකාරයෙන් දැක්වෙන අතර මෙම අංක දැක්වෙන්නේ ..................... **{ෂඩ් දශමය,අෂ්ටමය}** ආකාරයෙන්ය

R). ..................... **{හානි වන(lossy) ,හානි නොවන(lossless)}** සංකෝචනය භාවිතයෙන් නැවත විවෘත කිරීමේ දී එහි ස්වභාවික ස්වරූපය දක්නට ලැබෙන [GIF,PNG,RAW] වැනි ගොනු ආකෘති ද ග්‍රාපික සම්පාදනය සඳහා භාවිතා කරයි.

S). ඍජු හෝ වක්‍ර රේඛා එකට එකතු වීමෙන් ..................... **{වෙක්ටර් (vector)/රාස්ටර් (raster)}** අනුරූ නිර්මාණය වේ.

(iii) K- N තෙක් වූ ලේබල මගින් පෙන්වා ඇති විස්තර පහත දී ඇති පද ලැයිස්තුවෙහි ඇති නිවැරදි පද හා ගළපන්න. එක් එක් ලේබනය ඉදිරියෙන් නිවැරදිව ගලපා ගත් පදයේ අංකය **ලේබලය → පදයේ අංකය** යන ආකාරයෙන් ලියා දක්වන්න.

| **ලේබලය** | **විස්තරය** |
|---|---|
| K | ශ්‍රී ලංකාවේ පරිගණක ජාල හා පරිගණක මෙහෙයුම් පද්ධති වලට සයිබර් ආරක්ෂාව සපයන ආයතනයකි |
| L | පරිගණක වෛරස මෙන් හානිදායක නොවුණත් පරිශීලකයා මානසික වශයෙන් පීඩාවට පත්කරන වානිජ තොරතුරු ලබා දෙන හානිකර මෘදුකාංගයකි |
| M | ඉලෙක්ට්‍රොනික පොත්පත් හා සඟරා හේතුවෙන් පුස්තකාල වැසී යාම හා ඒ ආශ්‍රිත රැකියා අහිමිවීම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ කුමන අතුරු ප්‍රතිඵලයක් ද? |
| N | නව නිපයුම් සඳහා රජය විසින් ප්‍රදානය කරනු ලබන බුද්ධිමය අයිතිවාසිකම |

පද ලයිස්තුව : **{de-skilling, ICTA, Adware, පේටන්ට්, Plagiarism, Malicious codes}**

**3.** (i) වාහන කුලියට සපයන ආයතනයක් එහි රියදුරන්, වාහන පිළිබඳ දත්ත ගබඩා කිරීමට දත්ත පාදකයක් භාවිතා කරයි. එම දත්ත පාදකයෙන් කොටසක් පහත දැක්වේ.

**Vehicle Table**

| V_ID | Type |
|---|---|
| V01 | Car |
| V02 | Van |
| V03 | Bus |

**Driver Table**

| D_ID | Type |
|---|---|
| D001 | Nimal |
| D002 | Shantha |
| D003 | Lakmal |

Visit- www.enenapiyasa.lk

**Trip Table**

| D_ID | V_ID | Place | Date | Fees |
|---|---|---|---|---|
| D001 | V02 | Colombo | 2022/01/20 | 5000.00 |
| D002 | V01 | Kandy | 2022/01/25 | 8000.00 |
| D001 | V03 | Katharagama | 2022/02/04 | 12000.00 |
| D003 | V01 | Galle | 2022/02/04 | 3000.00 |

(i)(a) **Driver** වගුවෙහි ප්‍රාථමික යතුර සඳහා යොදාගත හැකි ක්ෂේත්‍රය නම් කරන්න.

(b) **Trip table** හි ආගන්තුක යතුර සඳහා යොදාගත හැකි ක්ෂේත්‍ර දෙකක් නම් කරන්න.

(ii) ලක්මාල් නැමැති රියදුරා 2022/02/10 වන දින මාතර දක්වා වෑන් රථය රුපියල් 5000/= කට ලබාගෙන කුලී ගමනක් යයි

(a) ඉහත තොරතුරු ඇතුළත් කිරීමේ දී යාවත්කාලීන කලයුතු වගුව/ වගු මොනවාද?

(b) යාවත්කාලීන කලයුතු වගු/ වගුවේ අදාළ රෙකෝඩය /රෙකෝඩ ලියා දක්වන්න.
සෑම රෙකෝඩයකම **වගුවේ නම → (ක්ෂේත්‍රය 1, ක්ෂේත්‍රය 2, .......)** ආකෘතිය භාවිතාකරන්න.

(iii) **Trip** වගුවේ ක්ෂේත්‍ර සඳහා යොදා ගත හැකි දත්ත රූප නම් කරන්න

(iv) මෙම වගු අතර පවතින සම්බන්ධතාව හඳුනාගෙන ලියා දක්වන්න

(v) මසකට වරක් කුලිය ද රථයේ අංකය(V_ID) දිනය කුලී ගාස්තුව හා රියදුරු නම ඇතුළත් වාර්තාවක් අවශ්‍යව ඇත. මේ සඳහා විමසුමක් ලිවීමේදී සම්බන්ධ කරගත යුතු අදාළ වගු මොනවාද?

**4.** (i) a හා b කොටස් වල පිළිතුරු ලිවීම සඳහා පහත උපදෙස් භාවිතා කරන්න.

(a) P- S තෙක් ලැයිස්තුව සඳහා ගැලපෙන විස්තරය **ලේබලය → විස්තරයේ අංකය** ආකාරයෙන් ලියා දක්වන්න.

| ලේබලය | විස්තරය |
|---|---|
| P - ICMP | 1. විවෘත කේත CMS මෘදුකාංගයකි. |
| Q - PaaS | 2. දෝශ ඇති අවස්ථාවල පණිවිඩ දැක්වීම හා හුවමාරුව පාලනය කරයි. |
| R - SMTP | 3. මෘදුකාංග සංවර්ධනය සහ මෘදුකාංග ධාවනය අවශ්‍ය පරිසරය ලබා දෙයි. |
| S - Joomla | 4. විද්‍යුත් තැපැල් හුවමාරුව පාලනය කරයි. |

(b) A, B, C, D ලේබලය සහිත හිස්තැන් පිරවීම සඳහා යෝග්‍ය පද ලැයිස්තුවෙන් හඳුනාගෙන **ලේබලය → පදය** යන ආකාරයෙන් ලියා දක්වන්න .

...........A............ හා TIFF ගොනු ආකෘතිය මගින් ග්‍රාපික සංකෝචනයේ දී මුල් නිර්මාණයේ තත්ත්වයෙන් ...........B............ නිසා...........C........... සංකෝචනය ලෙස හැඳන්වේ. ...........D........... සංකෝචනය මගින් මුල් නිර්මාණය එම තත්ත්වයෙන්ම විවෘත වේ.

පද ලැයිස්තුව : {GIF, JPEG, හානි වන, රාස්ටර්, හානි නොවන, විවෘත වන, විවෘත නොවන}


(ii) රූපය 1 හි පෙන්වනු ලබන වෙබ් පිටුවෙහි HTML ප්‍රභවය, එහි සමහර උසුලන නොමැතිව සහ ඒවා 1 සිට 10 දක්වා ලේබල් කිරීමක් සමගින් රූපය 2 හි පෙන්වා ඇත.
ඔබ විසින් ලිවිය යුත්තේ එක් එක් ලේබල අංකය සහ ඒ හා ගැලපෙන, දී ඇති ලැයිස්තුවෙන් තෝරා ගත් HTML උසුලන පමණි.

ලැයිස්තුව : {middle, h1, center, table, title, tr,th, dt, img, a, dl, ul}

Visit- www.enenapiyasa.lk

# *Tourist arrivals to Sri Lanka for 2022*

**Sri Lanka has launched several online programs to increase tourism from alternative destinations. Due to the ongoing war between Russia and Ukraine, resulting in an energy crisis, thousands of tourists from Europe are expected to visit Sri Lanka in November and December..**




Tourist arrivals to Sri Lanka

| Months | Number of tourists |
|---|---|
| May | 30207 |
| June | 32 856 |
| July | 47293 |

**For futher information:** [Dailly Mirror](https://www.dailymirror.lk/)

Monthly Arrivals
    May arrivals totalled 30207
    June arrivals totalled 32,856
    July arrivals totalled 47,293

**රූපය 1 : වෙබ් පිටුව**

```
<html>
        <head>
                <❶ > Tourist arrivals to Sri Lanka </❶ >
        </head>
        <body>
                < ❷ > < ❸> <i>Tourist arrivals to Sri Lanka for 2022 </ ❸ > </ ❷ > </i>
                <h3>Sri Lanka has launched several online programs to increase tourism
                from alternative destinations. Due to the ongoing war between Russia and Ukraine,
                resulting in an energy crisis, thousands of tourists from Europe are expected to visit Sri Lan-
ka                      in November and December..</h3>
                < ❸ > < ❹ src="tourist gragh.jpg"></ ❸ >
                < ❸ > < ❺ border="1"  width ="500" height="200">
                        < ❻ > Tourist arrivals to Sri Lanka</ ❻ >
                        <tr>    < ❼ >Months</ ❼ >
                                < ❼ > Number of tourists </ ❼ >
                        </tr>
                        <tr>    <td> May </td> <td> 30207 </td> </tr>
                        <tr>    <td> June</td> <td> 32 856 </td> </tr>
                        <tr>     <td> July</td> <td> 47293 </td> </tr>
                </ ❺ > </ ❸>
                <h3>
                For futher information: < ❽ href="https://www.dailymirror.lk/"> Dailly Mirror </ ❽ >
                        </h3>
                < ❾ > < ❿ > Monthly Arrivals</ ❿ >
                <dd> May arrivals totalled 30207</dd>
                <dd> June arrivals totalled 32,856</dd>
                <dd> July arrivals totalled 47,293 </dd>
                </ ❾ >
        </body>
</html>
```

**රූපය 2 : HTML ප්‍රභවය**






Visit- www.enenapiyasa.lk

**5.** (i)




ඉහතින් දැක්වෙන වදන් සැකසුම් ලේඛනයේ හැඩසවි ගැන්වීම සඳහා යොදා ගෙන ඇති මෙවලම් ඊට පහතින් දැක්වෙන නිරූපක (P-W) අතරින් හඳුනාගෙන **ලේබලය (1-5) → නිරූපකය (P-W)** ආකාරයට ලියා දක්වන්න.

| මෙවලම |  |  |  |  |  |  |  |  |
|---|---|---|---|---|---|---|---|---|
| නිරූපක | P | Q | R | S | T | U | V | W |

(ii)

| | A | B | C | D | E | F | G | H | I | J |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | Vijitha VS Ananda Cricket Tournament | | | | | | | | | |
| 3 | Player | ඉනිම (Matches) | ලකුණු (Runs) | පන්දුවට පහර දීමේ සාමාන්‍ය Average | පන්දු දැමීමේ ඕවර ගණන (Overs) | ඕවර් ගණනේදී ලබා ගත් ලකුණු | නිපන්දු ඕවර MDNS | නිපන්දු ලකුණු- Wide | කඩුළු Wickets | පන්දු දැමීමේ සාමාන්‍ය |
| 4 | Nisal | 5 | 110 | 22 | | | | | | |
| 5 | Janitha | 5 | 250 | 50 | 2 | 18 | 1 | 1 | 5 | 9 |
| 6 | Dasun | 3 | 85 | 28.33 | 20 | 240 | 0 | 1 | 2 | 12 |
| 7 | Binura | 3 | 61 | 20.33 | 23 | 176 | 1 | 0 | 1 | 7.65 |
| 8 | Dhanajaya | 5 | 283 | 56.6 | | | | | | |
| 9 | ඉනිම පහේ පිති කරුවන්ගේගේ මුළු ලකුණු | | | | | | | | | |
| 10 | වැඩිම ලකුණු ලාභියා | | | | | | | | | |
| 11 | අවම පන්දු යැවීමේ සාමාන්‍ය සහිත ක්‍රීඩකයා | | | | | | | | | |

ඉහත දක්වා ඇත්තේ එක්තරා ක්‍රීඩා සමාජ දෙකක් අතර පැවති ක්‍රිකට් තරගාවලියක ලකුණු විශ්ලේෂණය කිරීම සඳහා නිර්මාණය කරන ලද පැතුරුම්පතක ආකෘතියකි එය ඇසුරෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(a) කණ්ඩායමේ ක්‍රීඩකයන්ගේ ඉනිම පහේම මුළු ලකුණු ලබා ගැනීමට B9 කෝෂයට ඇතුළත් කළ යුතු ශ්‍රිතය *=Function(cell1:cell2)* ආකාරයෙන් ලියා දක්වන්න.

(b) නිසල්ගේ ලකුණු ලබා ගැනීමේ සාමාන්‍ය දැක්වීමට D4 කෝෂයට ඇතුළත් කළ යුතු සූත්‍රය D8 දක්වා පිටපත් කළේ යැයි සිතන්න. ඒ විට D8 කෝෂයේ දැක්වෙන සූත්‍රය ලියා දක්වන්න.


(c) පන්දු යැවීමේ දී අවම සාමාන්‍ය අගය සොයා ගැනීමට B11 කෝෂයට ඇතුළත් කළ යුතු ශ්‍රිතය *= Function2 (cell3:cell4)* ආකාරයෙන් ලියා දක්වන්න.

Visit- www.enenapiyasa.lk

(c) ඉනිම පහේදීම වැඩිම ලකුණු ලාභියා ලබා ගැනීමට B10 කෝෂයට ඇතුළත් කළයුතු සූත්‍රයේ අදාළ කෝෂ පරාසය (Cell5:cell6) ආකාරයට ලියා දක්වන්න.

(d) ක්‍රීඩකයන් පස්දෙනාගේ ලකුණු දැක්වීම සඳහා වඩාත්ම සුදුසු ප්‍රස්තාර වර්ගය කුමක්ද?

**6.** (i) (a) පවන් තමාගේ පරිගණකයේ තම සොහොයුරා වන නිසල් ද සමඟ සහයෝගයෙන් කටයුතු කරයි.ඔවුන් දෙදෙනා තමන්ගේ විෂය (Curricular) සහ විෂය සමගාමී (Co-curricular) ක්‍රියාකාරකම් සඳහා වෙන වෙනම ෆෝලඩර පවත්වාගෙන යනු ලබන අතර පහත දක්වා ඇත්තේ ඔවුනගේ ෆෝල්ඩර ලැයිස්තුවකි.
දී ඇති **ෆෝල්ඩර ලේබලය → නම** යන ආකාරයෙන් නිවැරදි ව තෝරා ලියන්න.




පවන් විෂය සමගාමී ක්‍රියාකරම් සඳහා පරිසරහට කණ්ඩායමට සහභාගී වි සිටින අතර නිසල් පාසල් ශිෂ්‍යබට හා වෙස් සමාජයට සම්බන්ධ වී ඇත.

(b) පවන් පරිගණකයේ කාර්යක්ෂමතාවය පෙරට වඩා අඩු වී ඇති බව ICT ගුරුතුමා සමඟ පැවසූ විට ඔහු කියා සිටියේ ගොනු ඛණ්ඩනය සිදු වී ඇති බවයි. මේ සඳහා ගත හැකි ක්‍රියාමාර්ගය ලියන්න.

(c) පවන්ගේ පරිගණකය ඉහත දක්වා ඇති පරිදි C,D ලෙස පංගු බෙදුමට ලක් කර ඇත. මෙසේ පංගු බෙදීම අවශ්‍ය වීමට හේතු 02 ක් ලියන්න.

(ii) E-Medicheck ආයතනයේ සායනවල තොරතුරු කළමණාකාරීත්වයට තොරතුරු පද්ධතියක් සැකසීමට තීරණය කරන ලදි.ප්‍රධාන වෛද්‍යතුමිය තොරතුරු පද්ධතියේ සැලසුම් කිරීමට සහය වු අතර IT අංශය මගින් පද්ධතිය ගොඩනගන ලදි. අනතුරුව ප්‍රධාන වෛද්‍යතුමිය මෘදුකාංගය පරීක්ෂා කිරීමේ කාර්ය සිදුකළ අතර මෘදුකාංගය ස්ථාපනය IT අංශයේ සුනිල් මහතා විසින් සිදුකරන ලදි.

(a) ප්‍රධාන වෛද්‍යතුමිය විසින් අවශ්‍යතා හඳුනා ගැනීමේදී තොරතුරු එක්රැස් කල ආකාර 02 ක් සඳහන් කරන්න.

(b) පද්ධතිය පිහිටුවීමෙන් පසු කාර්යය මණ්ඩලයට පහත උපදෙස් ලබා දෙන ලදි. "ඉදිරියටද සායනයේ සියළු සටහන් පෙර පරිදි ලේඛනගතව තබා ගන්න." මෙම ප්‍රකාශයට අනුව තොරතුරු පද්ධතිය ස්ථාපනය කල ක්‍රමය කුමක්ද?

(c) E-Medicheck ආයතනයේ සායනවල තොරතුරු අත්යුරු තොරතුරු පද්ධතියකට වඩා පරිගණක පාදක තොරතුරු පද්ධතියට මාරු විම සම්බන්ධයෙන් ඇති වාසි 02ක් ලියන්න.

(d) මෙම ආයතනය විසින් තොරතුරු පද්ධතිය නිර්මාණය කිරීමේ දී පියවරෙන් පියවර පද්ධතිය අවසන් කරන ලදි.මේ සඳහා යොදා ගත් පද්ධති සංවර්ධන ආකෘතිය කුමක්ද?

Visit- www.enenapiyasa.lk

**7.** (i) සියළුම ස්ථානවල බිංදු සහිත පහත දක්වා ඇති X අරාව (Array) සලකන්න.

| | X =[0] | X =[1] | X =[2] | X =[3] | X =[4] |
|---|---|---|---|---|---|
| **X =** | **0** | **0** | **0** | **0** | **0** |

පහත පෙන්වා ඇති ව්‍යාජ කේතය ඉහත X අරාව මත ක්‍රියාත්මක වූ පසු P, Q, R, S, T හි අගයන් සොයන්න.

```
Begin
        Num=10
        I=0
        Repeat
                X[i]=Num
                Num =Num * 2
                I=i+1
        Until i>5
End.
```

| | X =[0] | X =[1] | X =[2] | X =[3] | X =[4] |
|---|---|---|---|---|---|
| **X =** | **P** | **Q** | **R** | **S** | **T** |

(ii) පහත දී ඇති ව්‍යාජ කේත කොටසට අදාල ගැලිම් සටහන අඳින්න.

```
Num=10
Count=0
While Count <=5
        Num: =Num+12
        Count: = Count+1
        Print Num
End while
```

☼ ☼ ☼ ☼

Visit- www.enenapiyasa.lk